

## කඳු මුදුනත සිට

දකිමි මම
මිටියාවත පිහිටි
ඔබේ මැඳුර කුඩාවට
පෙම්බරිය, එවිට
නොදකිමි මට...
අප අතර ඇති
පරතරය

**මාලතී රූපිකා පුංචිහේවා**

## අහස වී නුඹ

තතක සිර වී ස්වරය ගොළු වුණු
පුරුදු කවියක කනට කෙඳිරූ
එකම එක වැහි බිඳක් අතවත්
නො එවූ පදයකි සිතක රැඳුරූ
මුසුව තෙත මඳ නලක සිසිලස
අමතකව ගිය කලෙක නුදුරූ
අහස වී නුඹ ඔහොම හිටපං
පියාපත් මට තිබෙයි සොඳුරූ

**මල්කා රත්නතුංග**

## ඒ රුව

කවුළුවෙන් එබෙනවා
කැඩපතින් බලනවා
පිටු අතර රැඳෙනවා
ඉඟි බිඟිය පානවා
සැමතැනම දකිනවා
සිනහ මුව පිපෙනවා
නෙත් පියා ගන්නවා
සිත වසා දමනවා
ඒත් යළි පෙනෙනවා

**අමිතා පද්මකුමාරි**

## පෙම් කෙරූ තැන

මා එදා කොළඹ ගිය දා
නුඹ නිහඬයි ඇයිද මන්දා
වෙනදා තිබූ සතුටු සිනහා
තිබුණේ නෑ අනේ මන්දා

කුරුලු රෑන් දෑත් අල්ලා
ගස් අතරේ පෙම් බැන්දා
එදා මා පෙම් කෙරූ තැන
අද වෙනකෙකු ඇයිද මන්දා

පාර පුරා ඔබේ රුව
මා සෙවුවේ කඳුළු මැද්දේ
තොරක් නැති සිනා රැල්
දසත පුරා මං සෙව්වා

**කුමාරි ප්‍රේමරත්න**



## ජූනියර් සීනියර්

උඩ බලාගෙන පාර දිග
සරසවියෙ ඇවිදින්න යන විට
මා වැටෙන්නට ගිය වෙලාවක
නැගණියක් අල්ලාගත් මගේ අත

තත්පරයෙන් මම බෑවුමක
ඇය නොසිටියා නම් එතැන
ඒ වෙලාවේ ඇයයි සීනියර්
එදා සිට මම තමයි ජූනියර්

**සුධර්මා සමරසේකර**



## දවසකට එනවද අම්මේ

ගෙදර යනකොට තවම ඉඳහිට කනත්තට ඇස් දුවනවා
අඩි හයක් යට තනිව ඉන්නා අම්මගේ රුව මැවෙනවා
දෙනෝදාහක් සෙනඟ අස්සෙන් තනිකමක් මට දැනෙනවා
එහෙව් මොහොතක නුඹ සොයා දුවන් එන්නට හිතෙනවා

හුස්ම හිරවෙන වෙලාවෙත් මට මතක් වෙන්නේ ඔයාවයි
ඉන්න ඕනෙම කාලේ ගියෙ ඇයි මගේ මුළු හිත කතාවෙයි
සසර තැනකදි කරපු පව් ටික ගෙවී ගොස් නම් හමාරයි
ඔයා නැති තැන මගේ හෙට දින අඳුරු කුටියක ගෙවී යයි

පුංචි පැතුමක් පතන්නම් මං හැකි වුණොත් ඉටුකරන්න
බුදුන් දැකලා නිවන් යන්නට කල් ගියොත් මට කියන්න
එහෙව් දවසක ආයෙමත් මගෙ අම්මා විදිහට වඩින්න
හුඟක් දේවල් තියෙනවා මට ඔයත් එක්කල කියන්න

**ආර්.එම්. සකුන්තලා රත්නායක**

## නින්නාද

මිදුලේ තියෙන පැණි රඹුටන් ගහ යටට
අම්මේ ඇවිත් යනවද එක මොහොතකට
ඉස්සර වගේ රස කවියක් තාලයට
අහගෙන ඉන්න ආසයි නුඹ කියන විට

ලේනන් ලෑලි මත එහෙ මෙහෙ දුවන විට
බත් දුන් හැටි සිහිවෙයි නුඹ උදේ සිට
පූසන් ඇවිත් කෑමොර දෙයි දොරකඩට
මොනවා කියන්නද නුඹ ගැන මං උන්ට

ඉද්ද සමන් මල් පිපිලා කිරි සුදට
පංසල් යන්න සැරසෙනවා හරි හැඩට
ඇන්තූරියන් ඕකිඩ් මල් එක පෙළට
ඔසවන් බලයි හිස් නුඹ එන මඟ දෙසට

පොඩි දුව හොයයි අත්තම්මාගෙ හිනා කට
සේයාරුවක දිදුලයි නුඹෙ හිනා කැට
ඉටි මල් දමේ හැඩ කරනා විටදි පොට
කෑවද පුතේ ඇහුණා හඬ හෙමින් මට

**දිමුතු ප්‍රසාද් උඩුගමසූරිය**



## අවුරුද්ද නවතින්න!

සාමය රැඳුණු අවුරුදු දින ගෙවී ගියොත්
නාමය තිබෙද නව අවුරුදු ලැබූ බවත්
තාලය රැගෙන පැවසූ ඒ මියුරු වදන්
තාලය ගෙවෙද්දී අමතක නොවෙද සිතින්

පිදුවේ තුටින් සඟ ගණ සහ නෑයො කැලත්
බෙදා හදා ගත කළ ඒ උලෙළ නිමක්
වැඩිහිටියන් පුදා බුලතින් අසිරි ලබන්
ලැබූ ඒ යහ මඟට යා හැකි දුරකොතරම්

පදින ඔන්චිල්ලාව ආවා අවුරුදු කියා
මතක් කර දුන් සිරිත් පස්සටම ඇද දමා
තල්ලුවක් දුන් නිසයි ඉදිරියට ගියෙ කියා
කියනවා එදා සිට පදින උදවිය පවා

දොං දොම්ට තකදොං - අවුරුද්ද නවතින්න!
කොහා ආවා වගේ - මිතුරෙක්ට හැමදාම
මීනයෙන් මේෂයට - ලබන අවුරුදු දිනක්
ගෙනත් දෙන කල් ඉන්න - අවුරුද්ද අපි ළඟට

**නයනා රාජපක්ෂ**

## ආදරය පිරි ගැහැනු

ජීවිතේ දුක සැපද එකම නුලක එතුණු
හාමතේ කුස හඬන හඬට අවනත නොවුණු
ඒ වුණත් හිනාවී පෙර මඟට විත් රැඳුණු
අපි තමයි ජීවිතේ ආදරය පිරි ගැහැනු

ගහක හෝ වැලක හෝ විලක මල සේ පිපුණු
සුවඳ හෝ රුව එක්ක හිතකි සෙනෙහස පිරුණු
අතීතයෙ පටන් කවි පුරා රස කර වැයුණු
අපි තමයි ලෝකයක් මනබඳන මෘදු ගැහැනු

සිහින එක දෙක පිපී සිත් පුරා ගොඩගැහුණු
ඒ සිහින ලොව දිනන දා සිතේ මල් පිපුණු
දරූ බරත් කර තියං ඉරට කලියෙන් නැඟුණු
අපි තමයි ආදරේ පමණක්ම දුන් ගැහැනු

සිතන්නට දකින්නට දහසකුත් දේ රැඳුණු
නෙක පාට සුවඳ ඈ නොයෙක් දේ ගත ඇඳුණු
මලක් වුව ගලක් වන් දිරිය හිත ගත රැඳුණු
බිඳෙන විට පෑස්සෙන අපියි සියුමැලි ගැහැනු

වෙහෙසකට ලෙඩ දුකට නෙත කඳුළු නැඟුණු
දිරිය පිරි ළතෙත් හද බොහෝ ගුණදම් පිරුණු
දියණියකි මවකි ඈ කුලුණු ගුණ හද දැරුණු
බිරිඳ වේ ඈ ඔබට මෘදුව නලළත සිඹිනු

උතුරේද දකුණේද දසදිගින් එකතු වුණු
කම්හලට සිප්හලට රෝහලට පණ පෙවුණු
මව් වතින් හද තෙතින් කුලුණු ගුණයෙන් පිරුණු
නෙත් හඬන හිත් හයිය නෙක පාට අපි ගැහැනු

වඳිනු රිසි දේවාල හිස මතට වැටුණු
ඉකිගැහුම් හංග ගෙන ටච් කරන් මුහුණු
හිතේ හයියෙන් නැගිට ඇවිද යන ගැහැනු
දන්නවා ද ඉන්නවා මල් වගේ ගැහැනු
මල් වගේ හිනාවෙන ගල් වගේ ගැහැනු

අල්පයක් ලැබෙන තැන කල්පයක් රැඳුණු
සන්තකේ හිස් උනත් සින්නෙටම බැඳුණු
රැස්කරපු කිසිත් නැති හිස් වෙන්න තැනුණු
ඇත්තටම සුන්දරම දරාගත් ගැහැනු

හදවතම හිස් කළත් වචන විද මහ දැරුණු
ලෝකයක් සදන මව් ගුණ සදාකල් රැඳුණු
දුක් කදුළු සඟවාන සිනාවෙන් වත රැඳුණු
ලොවට සෙනෙහස බෙදන හිත සවිය ඇති ගැහැනු

කඳුළකට සරතැසට දොම්නසට කිපුණු
ඇසිල්ලක් වැලපිලා පිහදාන මුහුණු
දෙගුරු - හිමි - දරු - මිතුරු මත්තේම නැහුණු
ලොවක් වෙද කවදාක නැති කලෙක ගැහැනු

**වෛද්‍යවරියන් 14 දෙනෙක් එක්ව ලියූ කවි පන්තිය කාන්තාවන් වෙනුවෙන් පිදෙන ආදරයේ මල් මිටක්. ගංගා, මනෝරි, වසන්තා, වාසනා, මධුවන්ති, ෂෙල්මිනි, ඇනෙස්ටා, චරිඳු, බෝධිනී, ගයනි, දුලානි, මධුභානි, ජයමිණි, සිෂිකා)**

## උදම්

සැඩ ඉරක් ගිනි තැබූ
කාෂ්ටක මුඩු බිමේ
ඉපල් අතු අගිස්සක
තරුණ තටු විහිදමින්
තුඩින් ගී නද තබා
උදම් වූ කිරිල්ලක්
සක්වළ ගලින්
එහා කෙළවර
දිව් විමන් ඇත්තේ යැයි
මුමුණමින් තුටු වෙයි

ඉර මැදියමට දෙස් තියා
ඉපල් ගස් යට පා තබා
සුදහවක් නිවන්නට
ගෝස්තර සෙව්
මැහැලි වී ගිය ද
වැඩිවියට ඉස්සරින්
ඔයාකාරෙට පාරට්ටු කර
සෙයිලමේ රෑ දවල්
හිරිඔතප් සිල් බිඳුණු
සළු වෙච්ච ලිහිණියක්
දිව් විමන් යට
අපා දුක දැන
අනේ අපොයි
සුසුම් ලා
කිරිල්ලියක් ගැන
තැවෙන්නට විය

**අංජලී දාබරේ**

## වසත් සුළඟ

kavi.dinamina@lakehouse.lk

**ලිපිනය - අංක 35,
ඩී.ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.**

**සංස්කරණය-රජිත බස්නායක**

## සපතේරුවා

ටක් ටක් ටක්
ඔහු සපත්තුව සාදයි
තනි කකුලෙන් ඈ
සපතේරුවා දෙස බලා සිටී
වාහන දුම, දූවිල්ල
හෝ ගා වසාගනී නගරය
අහවරව කාරිය
නැඟුණී ඇය රියට
තබමින් දිගටි පියවර
ගල්තැලුම් පිරි නොන්ඩි ගමනින්
ඇවිද යයි සපතේරුවාද
විසල් පාවහන් සැල්
පසුකොට ඉදිරියට

**ජගත් ප්‍රසන්න කුරුගම**

## ගිම්හානෙක තනි වී

නිමා වූ වසන්තයක
අගිස්සේ
ජීවිතයට ගිම්හානය
උදා වූ කල
නිමා නොවනා දාහය
හමුවේ වුව
පුංචි ම පුංචි
අතු අග පිපි මලක් වුව
බලාපොරොත්තු
ජීවිත ආශාව දල්වන
සැනසුම කැන්දන
සුව දසුනකි

**නයන්ත ජගත් පුංචිහේවා**



## මුලංකාවිල් වැස්ස

හීන් හිරිකඩ වැටෙන වෙලාවට
ආසයි බලා ඉන්න
මුලංකාවිල් ගම් මායිමේ
තියෙන ලස්සන

තෙමුණත් කම් නෑ
මගේ හිත මට
කසුකුසු කරන්නේම
එහෙව් වෙලාවක
ගම් මායිමේ චුට්ටක් ඇවිදින්නය
ළා දම් පාට අහසයි
සිත් සීමාව සිප ගන්න
වැටෙන වැහි බිඳුයි
මවන සුරලොව

සිතුවම බලන්නට
සිත කොඳුරන්නේ
හෙවණකට වී හිඳ
මුලංකාවිල් වැස්සේ
ඒ මිහිරි හැඟුමේ
තුටුවෙමුයි කියා

මුලංකාවිල් වැස්ස
දිනක හමුවෙමු නැවත සුන්දර
දොඩමළුවකට

**සංජීව ප්‍රියන්ත තෝඩු**



## ඉවුරත නුඹ නමිනි


කැටි වලාකුළු රොත්තක
හීන විසිරෙන වැස්සක
මන්දාරමක් එක්කම
තෙමෙනුව අහසෙ හිස්කම


කඳු වළලු ඔක්කොම
මීදුම් දුමාරයකින් මැඩ
වැව් දිය රැලිති එක්කම
පිංතාරුවක් කරමින

නම නොදන්නා මල් වැටි
වැව් කැඩපතින් බලමින
සහෝදර සුළඟකට
හිස වනා සන් කරන

සීතල උණුසුම්ව පිළිගෙන
කවි භාෂාවකට පෙරළන
කලාවක් දත් සකියනි
ඉවුරත නුඹ නමිනි ඉඩ

**නයෝමී අමරසිංහ**





## මහගෙයි අතීතය

පරණ සුවඳක් අරන් ඇවිදින් ආයෙමත් ආදරයෙන්
නිවන සිසිලයි කවදා කොහෙදිත් මහගෙදර මතකයන්
දිරපු උළුවහු අතර පතරින් බේරී එන වැහි බිංදුවක්
නිදපු හැටි තාම මතකයි නැහැ එහි කිසිම රහසක්
කියපු රස කවි ගෙතූ කතන්දර අම්මගේ තුරුලේ නොනිද
දැකපු ඒ මහගෙයි අතීතයේ පහන නිවිලා මතකයක්
සෑමදා නොවරදා සිංහල අවුරුද්ද සැමරුව තාත්තා
නොවරදා මහ ගේම පාටින් පාට කෙරුවේ තාත්තා
මෙදා දැලි බැඳි කුස්සි බිත්තියේ හයිය කළුවර ගහට ගත්තා
එදා වාගේ නොවෙයි මහගෙයි හුඟක් දේ නැතිවෙන්න ගත්තා

**රවීනා අනුපමා
කැලණිය විශ්වවිද්‍යාලය**